© සියලුම හිමිකම් ඇවිරිණි

අනු අංකය: ………………

# ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය

## අන්තර්මධ්‍ය අදියර

## 2009 සැප්තැම්බර් විභාගය

විභාග දිනය : 2009 සැප්තැම්බර් 27

විභාග වේලාව : පෙ.ව. 9.30 - ප.ව. 12.30

පිටු ගණන : 02

ප්‍රශ්න ගණන : 07

අයදුම්කරුවන්ට උපදෙස්:

1. නියමිත කාලය පැය 3 කි.
2. ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.
3. පිළිතුරු සැපයිය යුත්තේ සිංහල භාෂාවෙන් පමණි.

| විෂය | විෂය සංකේතය |
|---|---|
| ව්‍යාපාර හා සමාගම් නීතිය | (BCL / 604) |

**ප්‍රශ්න අංක 01** *(ලකුණු 20)*

(a) ප්‍රසංගයක් සඳහා ඇලෙක්ස් විසින් මාටින්ගේ ප්‍රසංග ශාලාව වෙන්කරවා ගන්නා ලදී. මුළු කුලිය රු. 100,000/- ක් වූ අතර අත්තිකාරමක් වශයෙන් රු. 50,000/- ක් ඇලෙක්ස් ඔහුට ගෙවීය. ප්‍රසංගය පැවැත්වීමට නියමිත දිනට පෙර දින ගින්නකින් ශාලාව විනාශ විය. ප්‍රසංගය අවලංගුවීම වෙනුවෙන් අලාභය හා ගෙවූ රු. 50,000/- ක අත්තිකාරම් මුදල ආපසු ලබාගැනීම සඳහා මාටින්ට විරුද්ධව ක්‍රියාකිරීමට ඇලෙක්ස් අදහස් කරයි.

ඇලෙක්ස්ට මෙවැන්නක් කළ හැකි ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 12)

(b) ''අතීත ප්‍රතිෂ්ඨාව ප්‍රතිෂ්ඨාවක් නොවේ'' යන නීතියේ අදහස පැහැදිලි කරන්න. (ලකුණු 08)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක 02** *(ලකුණු 20)*

(a) විනිමය බිලක් යැයි සඳහන් ලියවිල්ලක අඩංගු වී ඇතැයි අදහස් කෙරෙන පහත සඳහන් දෑයෙහි නීතිය වලංගුභාවය ඒවා නියමිත විනිමය බිලකට ඇතුලත් වී ඇත්නම් පැහැදිලි කරන්න.

(i) 10% ක වාර්ෂික පොලියකුත් සමග A ට හෝ ඔහුගේ විධානයට 2008 ජුලි 30 දින රු. 10,000 ක් ගෙවනු.

(ii) 2008 ජුලි 30 දින රු. 10,000 ක් A ට හෝ B ට ගෙවනු. (ලකුණු 08)

(b) 'මෙවන්' බැංකු ගිණුමක් විවෘත කළේ ය. චෙක්පත්වල වම් කෙළවරේ හරස් අතට රේඛා දෙකක් ඇඳ ඒ තුළ ''ආදායකයාගේ ගිණුම'' යනුවෙන් රේඛනය කළ යුතු බව නීතිඥයා මෙවන්ට උපදෙස් දුන්නේ ය.

මෙවැනි උපදේශයක ඇති වැදගත්කම පිළිබඳව මෙවන්ට පැහැදිලි කරන්න. (ලකුණු 12)

(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 03</u>** *<u>(ලකුණු 20)</u>*

(a) සමාගමක් සංස්ථාපනය කිරීම උදෙසා නිසි ලෙස සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයක් ලැබුණ විට සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් කුමන විස්තර සංස්ථාපන සහිතකයේ විශේෂයෙන්ම සඳහන් කළ යුතු ද යන්න දක්වන්න. (ලකුණු 08)

(b) වෘත්තීය සමිතියක් යනු කුමක් දැයි පැහැදිලි කර කර්මාන්ත නීති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් (වෘත්තීය සමිති නීතිය) සංවිධානය වීමේ 'නිදහස' (freedom of association) සම්බන්ධයෙන් බලපවත්නා ව්‍යවස්ථාපිත නියමයන් සඳහන් කරන්න. (ලකුණු 12)

(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 04</u>** *<u>(ලකුණු 20)</u>*

සමාගමක් ස්වේච්ඡාවෙන් විසුරුවා හරින අවස්ථා පැහැදිලි කර, ස්වේච්ඡාවෙන් විසුරුවා හැරීමේ දී සැලකිල්ලට ගත යුතු ක්‍රියා පිළිවෙල හා ප්‍රතිවිපාක කෙටියෙන් සඳහන් කරන්න. (මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 05</u>** *<u>(ලකුණු 20)</u>*

භාවිතයේ දී ණයකර, කොටස්වලින් සැලකිය යුතු අන්දමින් වෙනස්වන බවක් නොසැලකේ. විහාව ආයෝජකයින් සමාගමක කොටස්කරුවෙකු වන්නේ ද නැතහොත් ණයහිමියෙකු වන්නේ ද යන තීරණය ගැනීම ඇත්ත වශයෙන්ම සලකා නොබැලේ.

ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? කොටස් සහ ණයකර අතර ඇති සමානකම් හා අසමානකම් සාකච්ඡා කරන්න. (මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 06</u>** *<u>(ලකුණු 20)</u>*

(a) අරුන් සහ බාලා සමාගමක හවුල්කරුවන් ය. සමාගම විසින් දී ඇති සාවද්‍ය උපදෙස් නිසා එල්මෝ අරුන්ට එරෙහිව නඩු පවරා ඇත. අරුන්ට එරෙහිව එල්මෝ ලබාගත් නඩු තීන්දුව අනුව ප්‍රමාණවත් මුදල් නොමැති කම නිසා අරුන්ට මුළු මුදල ගෙවීමට නොහැකි වී ඇත. ඉතිරි මුදල ලබාගැනීමට එල්මෝ දැන් බාලාට එරෙහිව ක්‍රියා කිරීමට අදහස් කරයි.

හවුල් ව්‍යාපාර නීතිය සම්බන්ධයෙන් එල්මෝට උපදෙස් ලබා දෙන්න. ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 10)

(b) ලාභ බෙදාගැනීමෙන්ම පමණක් හවුල් ව්‍යාපාරයක් ඇති නොවන අවස්ථා පැහැදිලි කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 07</u>** *<u>(ලකුණු 20)</u>*

(a) එක බඳුනක ටින් 30 ක් අඩංගු ටින්කළ පළතුරු බඳුන් 300 ක් නලින් විසින් සැම්ට විකුණන ලදී. නලින් සැම්ට ප්‍රවාහනය කළ බඳුන් 300 තුළ එක බඳුනක අඩංගු වී තිබුණේ පළතුරු ටින් 24 ක් පමණි. සැම් මේ පළතුරු බඳුන් ප්‍රතික්ෂේප කිරීමට බලාපොරොත්තු වේ. කෙසේ වෙතත් ටින් 24 ක් අඩංගු බඳුනක වෙළඳපල මිල ටින් 30 ක බඳුනකට සමාන වේ.

ඉහත තොරතුරු අනුව නෛතික තත්ත්වය පැහැදිලි කරන්න. (ලකුණු 08)

(b) සීමිත ABC සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ වශයෙන් රාජා සේවය කරයි. ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉදිකරන්නන්ගේ සමාගමක් වූ කාර්යාල ගොඩනැගිලි ඉදිකරන්නන්ගේ සීමිත සමාගම රාජා ගිවිසුමකට එළඹියේ ය. සීමිත ABC සමාගමට නොදන්වා කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීමේ සීමිත සමාගම සමඟ ඇතිකරගත් ගිවිසුමෙන් රහස්‍ය ලාභයක් රාජා ලබාගත්තේ ය.

නියෝජ්‍යත්ව නීතිය යොදාගෙන රාජාට එරෙහිව සීමිත ABC සමාගමට ගත හැකි පිළියම් කවරේ ද යන්න පිළිබඳව ඔබ පිළිතුරුට හේතු දක්වමින් උපදෙස් ලබා දෙන්න. (ලකුණු 12)

(මුළු ලකුණු 20)

***ප්‍රශ්න පත්‍රය අවසානයි***

---